(පුනරුත්ථාපන කාර්යාංශය)

**ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය**

ආයතනයේ ලිපි ගොනු අංකය :පුනකොප්/පා/10 දිනය :2023/10/23

කළමණාකරන සේවා ලිපිගොනු අංකය : DMS/1864/SOR දිනය : 2024.01.30

1. **සේවා ගණය**
ප්‍රාථමික - ශිල්පීය

2. (අ) **සේවා ගණයට පැවරෙන කාර්යයන්හි ස්වභාවය පිළිබඳ පොදු නිර්වචනය.**
ආයතනයක් වෙත පැවරෙන කාර්යයන් ඉටු කිරීම හා පවත්වා ගෙන යාම සඳහා වන මූලික අවශ්‍යතාවයන් වන ඉදිකිරීම්, නඩත්තු, අලුත්වැඩියා, ආලෝකනය වැනි මූලික කාර්යයන් අතුරින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) හතර (04) වැනි මට්ටමේ කාර්මික පුහුණු සහතිකයක්/ප්‍රවීණතා සහතිකයක් මගින් තහවුරු කෙරෙන කාර්මික/ශිල්පීය/වෘත්තීය කුසලතාවන් අවශ්‍ය වන කාර්යයන් පවරනු ලබන තැනැත්තන්ගේ සහ ප්‍රවාහන කාර්යයන්හිදී අවශ්‍ය වන මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කෙරෙන මෝටර් රථ රියදුරු බලපත්‍රයක් දරන තැනැත්තන්ගෙන් සමන්විත සේවා ගණයකි.

(ආ) **සේවා ගණයට අයත් තනතුරු**

i. රියදුරු
ii. ජලනල කාර්මික/ජල මෝටර් ක්‍රියාකරු
iii. විදුලි කාර්මික/ජනක යන්ත්‍ර ක්‍රියාකරු

චමිර ගයාංග කන්නන්ගර
නියෝජ්‍ය අධ්‍යක්ෂ
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

(ඇ) **තනතුරට පැවරෙන කාර්යයන්**
**රියදුරු**

1. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි රාජකාරි අවශ්‍යතාවයන් සඳහා ප්‍රවාහන සේවා ලබාදීම.

2. පුනරුත්ථාපනලාභින්ගේ පාලන කටයුතු සඳහා, අසනීප තත්ත්වයන් වලදී රෝහල් කරා රැගෙන යාම සඳහා, නඩු වාරයන් වලදී බන්ධනාගාර වෙත/උසාවි වෙත රැගෙන යාම සඳහා, ළගම ඥාතින්ගේ අවමංගල්‍ය උත්සව සඳහා සහභාගි කරවීම සඳහා, උසාවි නියෝග මගින් ලබාදෙන වෙනත් අවශ්‍යතාවයන් සඳහා හා අවශ්‍යතාවය පරිදි පාලන අධිකාරිය විසින් පවරන ලද කාර්යයන් සඳහා අවැසි ප්‍රවාහන සේවය ලබාදීම.

3. කාර්යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි අවශ්‍යතාවය මත බාහිර සම්පත්දායකයින් සඳහා අවැසි ප්‍රවාහන පහසුකම් සැලසීම.

4. කාර්යමණ්ඩල සමාජිකයන්ගේ පාලන කටයුතු සඳහා, අසනීප තත්ත්වයන් වලදී රෝහල් කරා රැගෙන යාම සඳහා හා අවශ්‍යතාවය පරිදි පාලන අධිකාරිය විසින් පවරන ලද කාර්යයන් සඳහා අවැසි ප්‍රවාහන සේවය ලබාදීම.

5. කාර්යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ආහාරපාන, දේපළ හා උපකරණ ප්‍රවාහනය කිරීම.

6. රථ වාහන නිසි පරිදි නඩත්තු කිරීම, ධාවන වාර්තා (පොදු 268) සටහන් කිරීම, ආරක්ෂිත රිය ධාවනය, මාර්ග ධාවන නීති පිළිපැදීම.

7. කල් ඉකුත් නොවූ රියදුරු බලපත්‍රයක් තිබීම හා අවැසි අවස්ථාවන්හිදී රියදුරු බලපත්‍රය යාවත්කාලීන කර ගැනීම.

8. ධාවන වාර්තා (පොදු 268) සටහන් පෙතෙහි සඳහන්ව ඇති උපදෙස් පිළිපැදීම.

**ජලනල කාර්මික/ජල මෝටර් ක්‍රියාකරු**

1. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන් සඳහා සුදුසු ජල නල පද්ධති ස්ථාපනය කිරීම, අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සොයා බලා සිදු කිරීම.

2. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන් ආසන්නයෙහි පිහිටි පාවිච්චියට සුදුසු ජල මූලාශ්‍ර ඇත්නම් කාර්යාංශ උපදෙස් මත සවි කරනු ලබන ජලය පොම්ප කරනු ලබන යන්ත්‍ර ඇත්නම් ඒවා පිළිබඳ සොයා බලා නඩත්තු කිරීම.

3. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ඇති ජල නල පද්ධතීන්ගේ අලුත්වැඩියාවන් ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ යොදා නිවැරදිව සිදු කිරීම.

**විදුලි කාර්මික/ජනක යන්ත්‍ර ක්‍රියාකරු**

1. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ගොඩනැගිලි වල සියලුම විද්‍යුත් පරිපථයන්හි අලුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු සිදුකිරීම.

2. නිවැරදි නිර්ණායකයන්ට අනුව නව විදුලි උපාංග හා පරිපථ ස්ථාපනය කිරීම.

3. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්ට අයත් හා බාහිර ආයතන මගින් ලබා ගන්නා විදුලි ජනක යන්ත්‍ර ආරක්ෂාරී ක්‍රියා කරවීම හා නඩත්තුව.

4. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ඇති ආරක්ෂක විදුලි පහන් හා විදුලි වැට හදිසි බිඳ වැටීමකට ලක් නොවන අයුරින් පවත්වාගෙන යාම හා ඒ සඳහා ගත හැකි විකල්ප ක්‍රියා මාර්ග පෙර පුහුණුවීම් කර සූදානමින් සිටීම.

5. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි හදිසි විදුලිය බිඳ වැටීමක් සිදු වුවහොත් ක්ෂණිකව එය හඳුනා ගැනීම හා ඒ සඳහා ක්‍රියාත්මක වීම.

6. ජාතික විදුලි බල පද්ධතිය මගින් ලබාදෙන විදුලියෙහි බිඳ වැටීමක් සිදු වුවහොත් ආරක්ෂිත වැට/පිරික්සුම් ලාම්පු ක්ෂණිකව ජනක යන්ත්‍ර මගින් පණ ගැන්වීම සඳහා ක්‍රියා කිරීම.

7. අනවසර අයුරින් විදුලිය පාවිච්චි කිරීමට හැකි සියලුම මංපෙත් අසුරාලීමට අවැසි ක්‍රියා මාර්ග ගත යුතුය.

8. ජාතික අවශ්‍යතාවයක් වන විදුලිය අරපිරිමැස්ම පිළිබඳව මනා අවබෝධයකින් ක්‍රියා කළ යුතුය.

3. **පත්වීමේ ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත

4. **වැටුප් ක්‍රමය, කාර්යක්ෂමතා කඩඉම් හා ශ්‍රේණි ව්‍යුහය**

4.1 **සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය**

2020.01.01 දින සිට

PL 3 - 2016 - රු. (26,290 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12x 350 – 39,490)

4.2 **සේවා ගණයට අදාළ ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක මාසික වැටුප් පියවර**

| ශ්‍රේණිය | උදාළ ආරම්භක වැටුප් පියවර | PL 3 -2016 රු. |
|---|---|---|
| III | පියවර 01 | රු.26,290 |
| II | පියවර 12 | රු.29,290 |
| I | පියවර 22 | රු.32,320 |

චමිර ගයාංග කන්නන්ගර
නියෝජ්‍ය අධ්‍යක්ෂ
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

සෑම පත්වීම් ලිපියකම වැටුප් කේත අංකය, වැටුප් පරිමාණය හා ශ්‍රේණි ව්‍යුහය සම්පූර්ණයෙන්ම සඳහන් කළ යුතුය. සේවා ගණය තුළ ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ දී අලුතින් පත්වීමේ ලිපියක් නිකුත් කිරීම අවශ්‍ය නොවන අතර, උසස් කිරීමේ ලිපියක් පමණක් නිකුත් කිරීම සෑහේ.

**4.3 සේවක සංඛ්‍යාව**

| | |
|---|---|
| රියදුරු | - 36 |
| ජලනල කාර්මික/ජල මෝටර් ක්‍රියාකරු | - 03 |
| විදුලි කාර්මික/ජනක යන්ත්‍ර ක්‍රියාකරු | - 03 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III,II හා I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවට අයත් සේ සළකනු ලැබේ. අනුමත කරනු ලැබ ඇති පරිදි සේවා ගණයට අයත් සියලුම ශ්‍රේණි සඳහා වූ සමස්ත සේවක සංඛ්‍යාව මෙමගින් අදහස් කෙරේ.

**4.4 කාර්යක්ෂමතා කඩඉම්**

පත්කිරීමේ බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි.

**4.4.1** III වන ශ්‍රේණියට පත්වී වසර තුන (03)ක් ගත වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

**4.4.2** II වන ශ්‍රේණියට උසස්වී වසර තුන (03)ක් ගත වීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

**4.4.3** I වන ශ්‍රේණියට උසස්වී වසර පහ (05)ක් ගත වීමට පෙර තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

**4.4.4** අදාළ විෂය නිර්දේශය පහත 8 ඡේදයේ සඳහන් වේ. ඉහත සඳහන් පරිදි නියමිත කාලය තුළ අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් නොවන තැනැත්තන් පිළිබඳව ආයතන සංග්‍රහයේ සහ ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබේ.

**4.4.5** අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වර්ෂයකට අවම වශයෙන් එක් වතාවක් හෝ අවශ්‍ය වන විටක දී අවශ්‍ය වන පරිදි පවත්වනු ලැබේ.

**4.5** ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවනට අමතරව රජය විසින් කලින් කල තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා හා නිපුණතාවන්ද සියලුම සේවකයින් විසින් නියමිත පරිදි ලබා ගත යුතු වේ.

චමිර ගයාංග කන්නන්ගර
නියෝජ්‍ය අධ්‍යක්ෂ
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

## 5. ශිල්පීය සේවා ගණයට බඳවා ගැනීම

**5.1 සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

**රියදුරු**

**5.1.1 අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙන් සම්මාන දෙක (02)ක් සහිතව විෂයන් හය (06)කින් සමත් වීම.

**5.1.2 ප්‍රවීණතා**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

සහ

රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03)ක පළපුරුද්දක් ලබා තිබීම.

**ජලනල කාර්මික/ජල මෝටර් ක්‍රියාකරු**
**ශිල්පීය නිපුණතා**
ජලනල කාර්මික/ජල මෝටර් ක්‍රියාකරු තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

චමීර ගයාංග කන්නන්ගර
නියෝජ්‍ය අධ්‍යක්ෂ
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

**විදුලි කාර්මික/ජනක යන්ත්‍ර ක්‍රියාකරු**
**ශිල්පීය නිපුණතා**
විදුලි කාර්මික/ජනක යන්ත්‍ර ක්‍රියාකරු තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

5.1.3 **අභ්‍යන්තර අයදුම්කරුවන්**
**රියදුරු**
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03)ක පළපුරුද්දක් ලබා තිබීම.

සහ

ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**ජලනල කාර්මික/ජල මෝටර් ක්‍රියාකරු (පහත සුදුසුකම් 1 හෝ 2)**
1. ජලනල කාර්මික ක්ෂේත්‍රයෙහි වසර පහ (05)ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්

**හෝ**

2. ජලනල කාර්මික/ජල මෝටර් ක්‍රියාකරු තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**විදුලි කාර්මික/ජනක යන්ත්‍ර ක්‍රියාකරු (පහත සුදුසුකම් 1 හෝ 2)**
1. විදුලි කාර්මික ක්ෂේත්‍රයෙහි වසර පහ (05)ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්

2. විදුලි කාර්මික/ජනක යන්ත්‍ර ක්‍රියාකරු තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

චමීර ගයාංග කන්නන්ගර
නියෝජ්‍ය අධ්‍යක්ෂ
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

5.2 **වයස**
අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

5.3 **වෙනත්**

සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.

5.4 **බඳවා ගැනීමේ ක්‍රමවේදය**

ප්‍රසිද්ධ දැන්වීමක් හෝ පුවත්පත් දැන්වීමක් පළකිරීම මගින් අයදුම්පත් කැඳවීමෙන් පසුව තනතුරට අදාළ වන පරිදි වූ වෘත්තිය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

i. මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියලුම පත්කිරීම්/බඳවා ගැනීම් මෙන්ම සේවා ගණය උසස් කිරීම් ද මෙම පරිපාටියෙහි විධිවිධානයනට තරයේ අනුකූල වන 'පරිදි පමණක් සිදු කළ යුතුය.

ii. බඳවා ගැනීමෙන් පසු සේවයේ යෙදවීම හා ඊට අනුෂාංගික අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

iii. මෙම බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් සියලු කරුණු සම්බන්ධයෙන් මෙහි දැක්වෙන විධිවිධාන ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අභිබවා ක්‍රියාත්මක විය යුතු ය.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ආකාරය

| | | |
|---|---|---|
| අදාල පළපුරුද්ද | ලකුණු | 20 |
| අදාල අතිරේක අධ්‍යාපනික සුදුසුකම් | ලකුණු | 20 |
| සම්මුඛ පරීක්ෂණයේදි පෙන්වන ලද කාර්යසාධනය | ලකුණු | 60 |
| **මුළු ලකුණු ගණන** | | **100** |

හුදෙක්ම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු අනුව කුසලතා අනුපිළිවෙලින් අපේක්ෂකයින් තෝරා ගනු ලැබේ.

5.5 බඳවාගනු ලබන්නේ ඉහත කී සේවා ගණයේ III ශ්‍රේණියට පමණි. III ශ්‍රේණියට බඳවාගැනීමේ දී යම් වර්ෂක දී පත් කළ යුතු සංඛ්‍යාව වනුයේ එම වර්ෂයේ සේවා ගණයේ ඒකාබද්ධ සේවක සංඛ්‍යාව තුළ පැවති පුරප්පාඩු සංඛ්‍යාව වේ.

5.6 **සුදුසුකම් ලබන දිනය**

සේවයට/තනතුරට පත් කිරීම සඳහා වන බඳවා ගැනීමේ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරුවන් ඉහත 5.1, 5.2 හා 5.3 වන වගන්ති වල සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම අකාරයකින්ම සම්පුර්ණ කර ඇත්තේනම් පමණි.

5.7 **ස්ථිර කිරීම**

බාහිර අයදුම්කරුවන් අතුරින් සේවයේ/තනතුරේ III ශ්‍රේණියට පත්කරනු ලබන සේවකයකු වසර තුන (03)ක පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් සහ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබේ නම් පරිවාස කාලය අවසානයේදී සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ.

පත්කිරීම් සිදු කෙරෙන අවස්ථාව වන විට ද ආයතනයේ තනතුරක ස්ථීර කරනු ලැබ ඇති තැනැත්තන් අවුරුද්දක වැඩ බැලීමේ කාලසීමාවකට යටත්ව පත් කරනු ලැබේ.

චමිර ගයාංග කන්නන්ගර
නියෝජ්‍ය අධ්‍යක්ෂ
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය

5.8 **බඳවාගැනීමේ දී වැටුප**

බාහිර අයදුම්කරුවන් අතුරින් බඳවා ගැනීමේදී අදාල තැනැත්තා වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි පිහිටුවනු ලැබිය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටුවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

6. **උසස්වීම්**

කාර්යසාධනය පදනම් කර ගත් පහත දැක්වෙන ආකාරයේ උසස්වීම් ක්‍රමයක් හිමි වේ.

6.1 **සේවා ගණයෙහි III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.**

**(අ) පූර්ව අවශ්‍යතා**

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

**(ආ) උසස් වීමේ ක්‍රමය**

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධාරියා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා විසින් සිදුකරනු ලැබේ.

6.2 **සේවා ගණයෙහි II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.**

**(අ) පූර්ව අවශ්‍යතා**

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (9)ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09)ක් උපයාගෙන තිබීම.

ii. පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්න කර තිබීම.

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබීම.

**(ආ) උසස් වීමේ ක්‍රමය**

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධාරියා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා විසින් සිදුකරනු ලැබේ.

7. **සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම.**

අදාල නොවේ.

චමිර ගයාංග කන්නන්ගර
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ප්‍රමිතකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

## 8. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා විෂය නිර්දේශය

8.1 පහත සඳහන් සංරචකයන් ආවරණය වන පරිදි ඒ ඒ තනතුරට අදාළව විෂය නිර්දේශය සකස් කර ගත යුතුය.

8.1.1 පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (පත්වීමේ දින සිට වසර 03ක් ඇතුළත සමත් විය යුතුය.)

(අ) අදාළ සේවකයා සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳව අවශ්‍ය වන පරිදි දැනුම ලබා ඇත්දැයි මැන බැලීම.

(ආ) සාමාන්‍ය කාර්යාල ක්‍රම සහ ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තම සේවයට අදාළ දැනුම මැන බැලීම.

(ඇ) තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් හා ප්‍රවීණතාවක් අත්පත් කර ගෙන ඇත්දැයි මැන බැලීම.

චමිර ගයාංග කන්නන්ගර
නියෝජ්‍ය අධ්‍යක්ෂ
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකුම අවම වශයෙන් 40% ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ආයතනයේ පාලන අංශය සහ අදාළ අංශය නියෝජනය වන පරිදි ආයතනයෙහි විධායක නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

සේවයේ ස්ථිර කිරීම සඳහා සෑම සේවකයෙක්ම මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

8.1.2 දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය II ශ්‍රේණියට උසස්වී වසර 3ක් තුළ සමත් විය යුතුය.

(අ) පළමු වන කාර්යක්ෂමතා කඩයීම් පරීක්ෂණයේ දී මැන බලන ලද පරාසය ඇතුළත ගත වූ සේවා කාලය තුළ අදාළ ක්ෂේත්‍රයෙහි සිදුවී ඇති පරිපාටිමය, නීතිමය වෙනස්වීම් හා නව්‍යකරණය පිළිබඳ දැනුම හා ඒ සඳහා වන දිශාභිමුඛ වීම පිළිබඳ මැන බැලීම හා සේවකයාගේ ශිල්පීය ප්‍රවීණතාව ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වයට ගැලපෙන පරිදි වර්ධනය වී ඇතිදැයි මැන බැලීම.

(ආ) තනතුරට අදාළ ශිල්පීය කාර්යයන් පිළිබඳ කුසලතාවයන් සිය ජ්‍යෙෂ්ඨතාවය ගැලපෙන මට්ටමින් දියුණු කර ගෙන තිබෙදැයි මැන බැලීම.

දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකුම 40% ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ආයතනයේ පාලන අංශය සහ අදාළ අංශය නියෝජනය වන පරිදි ආයතනයෙහි විධායක නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

8.1.3 තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය I ශ්‍රේණියට උසස්වී වසර 05ක් තුළ සමත් විය යුතුය.

(අ) ඉහත 8.1.2 නිර්දේශය අදාළ පරිදි යොදාගත යුතු වේ.

තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සෑම අපේක්ෂකයෙකුම 40% ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ආයතනයේ පාලන අංශය සහ අදාළ අංශය නියෝජනය වන පරිදි ආයතනයෙහි විධායක නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.



චමිර ගයාංග කන්නන්ගර
නියෝජ්‍ය අධ්‍යක්ෂ
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය

**9. කාර්යයන් පැවරීම**

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකෙරෙන හෙයින් මෙම සේවා ගණය යටතේ වූ අදාළ තනතුරට පැවරෙන ඕනෑම කාර්යයන් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ඕනෑම ශ්‍රේණියක සේවකයකුට ආයතන ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

**10. පත්වීම් බලධාරියා**

පුනරුත්ථාපන කාර්යාංශයේ පාලක සභාව

චමීර ගයාංග කත්තන්ගර
නියෝජ්‍ය අධ්‍යක්ෂ
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

**11. අර්ථ නිරූපණ**

11.1 මෙම බඳවා ගැනීම් පරිපාටියට අදාල කාර්යයන් සඳහා "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ උසස්වීම් සඳහා ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න සේවා කාලය තුල යෙදුනු සියළුම වැටුප් වර්ධක ලබා ඇත්තා වූ ද, ඒ කාලය තුළ කළ වරදකට (අවවාද කිරීමක් හෝ තදින් අවවාද කිරීමක් හැර) දඬුවමක් ලබා නැත්තා වූ ද සේවා කාලයකි.

11.2 "නියමිත දිනය" යනුවෙන් අදහස් කරනුයේ මෙම ~~සේවයට~~/බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය වේ.

චමීර ගයාංග කත්තන්ගර
නියෝජ්‍ය අධ්‍යක්ෂ
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

මේජර් ජෙනරාල් ඩී සී යූ කේ හෙට්ටිආරච්චි (විශ්‍රාමික)
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී එම්ෆිල්
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්

දිනය : 23/10/2023

නිර්දේශ කරමි

රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අත්සන
(නිල මුද්‍රාව)

[illegible] පෙරේරා
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

දිනය : 2023/10/30

අනුමත කරමි.

Hiransa Kaluthantri
Director General
Department of Management Services
General Treasury
Colombo - 01

කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්
(නිල මුද්‍රාව)

දිනය : 2024.01.30